# ප්‍රධාන කරුණු සංක්ෂිප්තය

| BOC ජංගම ගිණුම් | | | | |
|---|---|---|---|---|
| **නිමැවුමේ ස්වභාවය** | **ගනුදෙනුකරුට ලැබෙන ප්‍රතිලාභ** | **ආරම්භක තැන්පතු හා ගාස්තු** | **සුදුසුකම්** | **ප්‍රධාන නියම හා කොන්දේසි** |
| ජංගම ගිණුම් | • **අන්තර්ජාල හා ජංගම බැංකුකරණ පහසුකම**<br>• **ජාත්‍යන්තරව පිළිගත් ඩෙබිට් කාඩ්පත්**<br>• **චෙක්පත් ඉක්මනින් නිෂ්කාශනයකිරීමේ හැකියාව**<br>• **ගනුදෙනුකරුගේ නමින් මුද්‍රිත චෙක්පොත් ලබාගැනීමේ හැකියාව**<br>• **එක් දිනකින් චෙක්පොත් නිකුත්කිරීම**<br>• **SMS Alert පහසුකම** | • **ආරම්භක තැන්පතුව**<br>- පුද්ගලික ගනුදෙනුකරුවන් (තනි පුද්ගල) සඳහා රු.7,500/-<br>- පුද්ගලික ගනුදෙනුකරුවන් (ව්‍යාපාර) සඳහා රු.7,500/-<br>- ව්‍යාපාර ගනුදෙනුකරුවන් සඳහා රු.15,000/-<br>- ආයතනික ගනුදෙනුකරුවන් සඳහා රු.250,000/-<br>කළමනාකරුගේ අභිමතය පරිදි විශේෂ අවස්ථාවන්හි දී ආරම්භක තැන්පතු අවශ්‍යතාව වෙනස් විය හැකිය.<br>• **ගිණුම වසාදැමීමේ ගාස්තු -රු 1,500/-**<br>• **ගිණුම පවත්වාගෙන යාමේ හා වෙනත් ගාස්තු**<br>- මාසික සේවා ගාස්තු<br>- අවම බැංකු අයිරා පොලිය<br>- චෙක්පත් අගරුවීමේ ගාස්තු<br>- ගෙවීම් නතරකිරීමේ ගාස්තු<br>- ජංගම ගිණුම් ප්‍රකාශ ගාස්තු<br>- බැංකු ප්‍රකාශවල අනු පිටපත් නිකුත්කිරීම<br>- චෙක්පොත් ගාස්තු<br>- මුදල් ඇනවුම් සකස්කිරීම<br>- ගිණුම් ශේෂ තහවුරුකිරීම<br>- ස්ථාවර නියෝග ලියාපදිංචිය සහ මුදල් හුවමාරුකිරීම්<br>- SMS Alerts ගාස්තු<br>- ATM කාඩ්පත් නිකුතුව<br>- ATM වෙතින් මුදල් ගැනීමේ සීමාව වෙනස්වීම<br>- අන්තර්ජාල බැංකුකරණ සේවා ගාස්තු<br><br>ගාස්තු දැනගැනීමට https://www.boc.lk/ratestariff#general-tariff වෙත පිවිසෙන්න | - පුද්ගලික<br>- බද්ධ<br>- තනි පුද්ගල ගිණුම්<br>- බෞද්ධ භික්ෂූන් සඳහා ගිණුම්<br>- හවුල් ව්‍යාපාර<br>- සීමිත වගකීම් සමාගම්<br>- සමිති, සංවිධාන සහ සංගම්, වෘත්තීය සමිති<br>- සමූපකාර සමිති<br>- රජයේ ගිණුම්<br>- රජයේ පාසල් ගිණුම්<br>- රජයේ නොවන පාසල් ගිණුම්<br>- රජයේ අමාත්‍යංශ හා දෙපාර්තමේන්තු<br>- පාර්ලිමේන්තු පනතින් ස්ථාපිත සංස්ථා/ මණ්ඩල<br>- රැස්කිරීමේ ගිණුම්<br>- රාජ්‍ය නොවන සංවිධාන<br>විසින් ගිණුම් ආරම්භ කළ හැකිය.<br><br>**ගිණුම විවෘතකිරීම සඳහා අනුගමනය කළයුතු පියවර**<br><br>**පුද්ගලික ජංගම ගිණුම්**<br>- ජාතික හැඳුනුම්පතේ (NIC)/ NIC අංකය දැක්වෙන වලංගු විදේශ ගමන් බලපත්‍රයේ පිටපතක්;<br>- දැන් සිටින ලිපිනය හා NICහි සඳහන් ලිපිනය වෙනස් වේ නම්, ලිපිනය තහවුරුකිරීමේ ලේඛන;<br>- ගිණුම විවෘත කරන බැංකු ශාඛාවට අයදුම්පතේ දී ඇති ස්ථිර ලිපිනය දුරින් පිහිටා තිබේ නම් ඒ සඳහා වලංගු හේතුවක් ද සමග,<br><br>ඉතුරුම්/ ජංගම ගිණුම් විවෘතකිරීමේ විශේෂ අයදුම්පත පුරවා ඕනෑම බැංකු ශාඛාවක් වෙත ලබාදෙන්න.<br><br>**පුද්ගලික නොවන ජංගම ගිණුම්**<br>අවශ්‍ය ලේඛන දැනගැනීම සඳහා ළඟම ඇති ලංකා බැංකු ශාඛාව අමතන්න. | • ආරම්භක අවම තැන්පතුව හා පවත්වාගෙන යායුතු අවම සාමාන්‍ය ශේෂය සඳහා 'මාසික ගාස්තු' වෙත යොමුවන්න.<br>• චෙක්පත් නිකුත්කිරීමට පෙර ප්‍රමාණවත් මුදලක් පවත්වාගත යුතුය.<br>• ගිණුම පවත්වාගෙන යාමේ ආකාරය පිළිබඳ බැංකුව සෑහීමට පත්නොවන විට එය වසාදැමීමට හෝ ඒ සම්බන්ධයෙන් ක්‍රියාකිරීමට බැංකුවට අයිතිය ඇත.<br>• ගිණුම අයිරාකිරීමට පෙර ගනුදෙනුකරු ඒ සඳහා පූර්ව කටයුතු සූදානම් කළ යුතුය.<br>• යාවත්කාලික ගාස්තු, පොලී අනුපාත සහ වෙනත් ගාස්තු දැනගැනීම සඳහා ගනුදෙනුකරුට බැංකු ශාඛාවකට පිවිසීමෙන් හෝ බැංකුවේ වෙබ් අඩවියෙන් ලබාගත හැකිය.<br>• ගිණුමේ සියලුම කොන්දේසි සහ ඒ සඳහා පිරිනමන පහසුකම් වෙනස්කිරීමට, එකතුකිරීමට හෝ ප්‍රතිශෝධනය කිරීමට ලංකා බැංකුවට බලය ඇත. |



**Classification: Internal**

## රක්ෂණ ආවරණ තැන්පතුව /අනවසර ගනුදෙනු (අතපසුවීම්)/ අක්‍රීය ගිණුම් පිළිබඳ වාර්තාකිරීම

- එක් තැන්පතුකරුවකුට රු.1,100,000 ක උපරිමයක් දක්වා වන්දි සඳහා අදාළ වාරික ගෙවීම මත මුදල් මණ්ඩලය විසින් ක්‍රියාත්මක ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනාක්‍රමය අනුව තැන්පතු වගකීම් රක්ෂණය කර ඇත.
- අනවසර/ අතපසුවූ ගනුදෙනුවක් හඳුනාගතහොත්, ඒ පිළිබඳ බැංකුවට හෝ ගිණුම පවත්වාගෙනයන ශාඛාවට වහාම වාර්තාකළ යුතුය.
- කිසිම මුදල් ආපසුගැනීමක්/ගෙවීමක් නොකර අවුරුද්දක (01) කාලයක් ගිණුම අක්‍රීයව පැවතියහොත්, එක් අවුරුද්දක් අවසානයේ ගිණුම 'අක්‍රීය' වනු ඇත.

අවුරුදු 10කට වැඩි කාලයක් එම ගිණුම් සක්‍රීයව පැවති බවට කිසිදු සාක්ෂියක් නොමැති නම්, එම ගිණුම්වල පවතින මුදල් අත්හැර දැමූ දේපළක් ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව වෙත මාරුකරනු ලැබේ.

## රක්ෂණ ආවරණ තැන්පතුව /අනවසර ගනුදෙනු (අතපසුවීම්)/ අක්‍රීය ගිණුම් පිළිබඳ වාර්තාකිරීම

- ගනුදෙනුකරුවන්ට පහත දැක්වෙන කුමන හෝ ක්‍රමයකින් සිය අදහස් සහ පැමිණිලි යොමුකළ හැකිය
- අපගේ ගනුදෙනුකාර අත්දැකීම් කළමනාකරණ අංශය හරහා ඔබේ ඇගයීම්/ පැමිණිලි යොමු කළ හැකිය. ඔබේ ඉල්ලීම් ස්වයංක්‍රීය පද්ධතියක් හරහා සලකා බලනු ලැබේ.
- දුරකතන: +94 11 220 4750 / +94 11 243 5814 ෆැක්ස්: +94 11 243 5815 විද්‍යුත් ලිපිනය: bocexmgt@boc.lk වෙබ් අඩවිය: https://www.boc.lk
- තැපැල: ගනුදෙනුකාර අත්දැකීම් කළමනාකරු, 22වන මහල, ලංකා බැංකු කුළුණ, ලංකා බැංකු චතුරශ්‍රය, අංක. 1, ලංකා බැංකු මාවත, කොළඹ 01.

අපගේ නිමැවුම් හෝ සේවා සම්බන්ධයෙන් ඇති ඕනෑම විමසීමක් අපගේ ඕනෑම බැංකු ශාඛාවක් වෙත හෝ ඇමතුම් මධ්‍යස්ථානය වෙත යොමු කරන්න. 1975 (ඇමතුම් මධ්‍යස්ථානය) අමතා ඔබට ළඟම ශාඛාව සොයාගන්න.